අධිකරණ අමාත්‍යාංශය

# අයිතිවාසිකම් ප්‍රකාශනය

## අත්අඩංගුවේ පසු වන පුද්ගලයෙකුට සපයනු ලැබේ
## පොදු නීතිය (ප්‍රංශ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 63 සහ 63-1 වගන්ති)

**පහත තොරතුරු ඔබට වැටහෙන භාෂාවකින් ලබා දිය යුතුය.**
ඔබ අත්අඩංගුවේ පසු වන කාලය පුරාම මෙම ලේඛනය තබා ගත හැකිය.

සිර ගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් කිරීම හෝ එසේ කිරීමට ඔබ උත්සාහ කර ඇති බවට සැක කිරීමට ඔබට විරුද්ධව හේතුවක් හෝ කිහිපයක් ඇති බැවින් ඔබ අත්අඩංගුවේ පසු වන බව ඔබට දන්වනු ලැබේ.

ඔබ සම්බන්ධ චෝදනාවේ යෝග්‍යතාවය, දිනය හා ස්ථානය සහ අත්අඩංගුවේ තබා ගැනීමට හේතු දැන ගැනීමට ඔබට අයිතියක් ඇත. අත්අඩංගුවේ පසු වන කාලය තුළ පැය 24 ක් දක්වා මෙම කරුණු පිළිබඳව ඔබට දැන ගන්නට ලැබෙනු ඇත.

මෙම කාල සීමාව අවසානයේ දී ඔබ මුහුණ දෙන දඬුවම අවම වශයෙන් වසරක සිර දඬුවමක් නම්, රජයේ නීතීඥවරයාට හෝ විමර්ශන විනිසුරුවරයාට අත්අඩංගුවේ තබන කාලය තවත් පැය 24 ක් දක්වා දීර්ඝ කිරීම පිළිබඳව තීරණය කළ හැකිය. මෙම මහේස්ත්‍රාත්වරයාට ඔබ ඔහු ඉදිරියට කැඳවන ලෙස නියෝග කළ හැකිය.

අත්අඩංගු කාලය අවසානයේ දී, ඔබ රජයේ නීතීඥවරයාගේ හෝ විමර්ශන විනිසුරුවරයාගේ තීරණයකට අනුව මෙම මහේස්ත්‍රාත්වරයා ඉදිරියට ගෙන එනු ඇත, නැති නම් නිදහස් කරනු ඇත. පළමු අවස්ථාවේ දී, ඔබගේ අත්අඩංගු කාලය අවසන් වී පැය 20 කට පෙර ඔබ විනිසුරුවරයෙකු ඉදිරියේ පෙනී සිටිනු ඇත.

# **එපමණක් නොව,** පහත දෑ සඳහා ඔබට අයිතියක් ඇති බව ඔබට දන්වනු ලැබේ:

## ඇතැම් පුද්ගලයින්ට දැනුම් දෙන්න

ඔබ සමග සාමාන්‍යයෙන් ජීවත්වන පුද්ගලයෙකු හෝ සෘජුවම ඔබෙන් පැවතෙන ඔබගේ දෙමව්පියන්ගෙන් එක් අයෙකු, හෝ ඔබගේ සහෝදර සහෝදරියන්ගෙන් එක් අයෙකු හෝ ඔබගේ භාරකරු හෝ සුදුසු වැඩිහිටියෙකු වෙත ඔබගේ අත්අඩංගුවට ගැනීමේ නියමය පිළිබඳව දුරකථනයෙන් දැනුම් දෙන ලෙස ඔබට ඉල්ලා සිටිය හැකිය.

ඔබට ඔබගේ සේවායෝජකයාටද දැනුම් දිය හැකිය.

ඔබ විදේශීය ජාතිකයෙකු නම්, ඔබගේ රටේ කොන්සියුලර් බලධාරීන්ට ද දැනුම් දිය හැකිය.

විසඳිය නොහැකි තත්වයක් නොමැති නම්, ඔබ ඉල්ලීමක් කළ වේලාවේ සිට පැය 3 කට නොඅඩු කාලයක දී මෙම පියවර ගැනෙනු ඇත.

ඔබ නීතිමය රැකවරණය යටතේ සිටී නම්, ඔබගේ රැකබලාගන්නාට, සුදුසු වැඩිහිටියෙකුට හෝ භාරකරුට එම ක්‍රියාමාර්ගය ගැන දැනුම් දෙනු ලැබේ.

කෙසේ වෙතත්, සාක්ෂි එක්රැස් කිරීම හෝ සංරක්ෂණය සඳහා හෝ පුද්ගලයෙකුගේ ජීවිතයට, නිදහසට හෝ අවංකභාවයට බරපතල අනතුරක් වළක්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය නම්, එම නිවේදනය ප්‍රමාද වනු ඇති බවට හෝ නිකුත් නොකෙරෙන බවට රජයේ නීතීඥවරයා හෝ විමර්ශන විනිසුරුවරයා විසින් තීරණය කරනු ලැබිය හැකිය.

## යම් පුද්ගලයෙකු සමග සන්නිවේදනය කරන්න

ඔබ අත්අඩංගුවේ තබා ඇති බව දැනුම් දිය හැකි පුද්ගලයෙකු සමග ලිඛිතව, දුරකථනයෙන් හෝ සම්මුඛ සාකච්ඡාවක දී සන්නිවේදනය කිරීම සඳහා ඉල්ලීමක් කිරීමට ඔබට හැකිය.

අත්අඩංගුවේ තබා ගැනීමට ඇති හේතු සමග නොගැලපේ නම් හෝ වරදක් සිදු වීමට ඉඩ තිබේ නම් ඔබගේ විමර්ශන නිලධාරියාට ඔබගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ හැකිය. මෙම සන්නිවේදනයේ වේලාව, කොන්දේසි සහ කාල සීමාව එකී නිලධාරියා විසින් තීරණය කරනු ලබන අතර, එය මිනිත්තු 30 නොඉක්මවිය යුතුය; එය සිදු වන්නේ නිලධාරියාගේ හෝ එම නිලධාරියා විසින් පත් කරන ලද පුද්ගලයකුගේ පාලනය යටතේය.

# වෛද්‍යවරයෙකු ලවා පරීක්ෂා කර ගන්න.

ඔබට වෛද්‍යවරයෙකු ලවා පරීක්ෂා කරන ලෙස ඉල්ලා සිටිය හැකිය. අත්අඩංගුව දීර්ඝ වුවහොත්, නැවත ඔබට වෛද්‍යවරයකු හමුවීමට ඉල්ලා සිටිය හැකිය.

ඔබ නීතිමය ආරක්ෂණ පියවරකට යටත් වන්නේ නම්, ඔබගේ රැකබලාගන්නාට, සුදුසු වැඩිහිටියෙකු හෝ භාරකරුට ඔබ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරන ලෙස ඉල්ලා සිටිය හැකිය.

# ප්‍රකාශ කරන්න, ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න, නැති නම් නිහඬව සිටින්න.

ඔබගේ අනන්‍යතාවය තහවුරු කළ පසු, ඔබගේ නඩු විභාගයේ දී ඔබට පහත සඳහන් දේවල් සඳහා අයිතියක් ඇත.

- ප්‍රකාශ නිකුත් කිරීම,
- ඔබෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු දීම,
- හෝ නිශ්ශබ්දව සිටීම.

# නීතිඥයෙකුගේ සහාය ලබා ගන්න

## නීතිඥයෙකු තේරීම

ඔබ අත්අඩංගුවේ රඳවා තිබීම ආරම්භයේ සිට, ඕනෑම වේලාවක නඩු විභාගයක් අතරතුර, සහ අත්අඩංගුව දීර්ඝ වන අවස්ථාවක් වුවහොත් - එම දීර්ඝ කිරීම ආරම්භයේ සිට - ඔබ කැමති නීතිඥයෙකුගේ සහාය ඔබට ඉල්ලා සිටිය හැකිය. ඔබට නීතිඥයෙකු පත් කර ගැනීමට නොහැකි නම් හෝ තෝරා ගත් නීතිඥයා සම්බන්ධ කර ගත නොහැකි නම්, ස්වයංක්‍රීයව නීතිඥයෙකු පවරා දෙන ලෙස ඉල්ලා සිටීමට ඔබට හැකිය.

ඔබ සම්බන්ධ කර ගත් අයෙකු විසින් ද ඔබගේ නීතිඥයා පත් කළ හැකිය. මෙම අවස්ථාවේ දී, නීතිඥයා පත් කිරීම ඔබ විසින් තහවුරු කළ යුතුය.

ඔබ නෛතික ආරක්ෂණ පියවරකට යටත් නම්, ඔබගේ රැකබලාගන්නා, සුදුසු වැඩිහිටියෙකු හෝ භාරකාරයා විසින් නීතිඥයෙකු පත් කරනු ලැබිය හැකිය; නැති නම් එසේ පත් කරන ලෙස නීතීඥ සංගමයේ සභාපතිවරයාගෙන් ඉල්ලා සිටිය හැකිය.

## නීති ආධාර සහ ප්‍රතිචාර කාලය

සම්මුඛ පරීක්ෂණයේ රහස්‍යභාවය සහතික කරන කොන්දේසි යටතේ නීතිඥවරයාට විනාඩි 30 ක් ඔබ හමු විය හැකිය. අත්අඩංගුව දීර්ඝ කිරීමක දී, ඔබට නැවත ඔබගේ නීතිඥවරයා හමු වීමට ඉල්ලා සිටිය හැකිය.

ඔබගේ ඉල්ලීම පරිදි නීතීඥවරයාට ඔබ සහභාගී වන නඩු විභාග, වාදවිවාද, ප්‍රතිනිර්මාණ හෝ හඳුනා ගැනීමේ සැසිවලට සහභාගි විය හැකිය.

මෙම අවස්ථාවේ දී, ඔබගේ පළමු නඩු විභාගය, එය ඔබගේ අනන්‍යතාවයට අදාල අංශවලට පමණක් සම්බන්ධ නොවන්නේ නම්, ඔබගේ ඉල්ලීම පිළිබඳ නීතිඥවරයාට දැනුම් දීමෙන් පසු පැය 2 ක කාලයක් ඉකුත් වීමට පෙර ඔබගේ නීතිඥවරයා නොමැතිව ආරම්භ නොවිය හැකිය. කෙසේ වෙතත්, ඔබගේ නීතිඥයා නොමැති විට දී පවා, රජයේ නීතිඥවරයාගේ (හෝ විමර්ශන විනිසුරුවරයාගේ) අවසරය මත විමර්ශනයේ අවශ්‍යතා එතරම්ම බරපතල නම්. ඔබගේ පළමු නඩු විභාගය වහාම ආරම්භ විය හැකිය.

නඩු විභාගයක් හෝ සංවාදයක් සිදු වෙන අතරතුර ඔබගේ නීතිඥයා පැමිණෙන්නේ නම්, ඔබගේ නීතිඥවරයා සමග කතා කිරීමට ඔබට ඉඩ ලබා දීම සඳහා ඔබගේ ඉල්ලීම පරිදි මෙය අත්හිටුවිය හැකිය.

කෙසේ වෙතත්, රජයේ නීතීඥවරයා, විමර්ශන විනිසුරුවරයා හෝ නිදහස හා භාරකාර විනිසුරුවරයා විසින්, ඔබ මුහුණ දෙන දඬුවම අවම වශයෙන් අවුරුදු පහක සිර දඬුමක් නම්, බලවත් හේතු සහ සුවිශේෂී පදනමක් මත, ඔබගේ නඩු විභාගවල දී හෝ සංවාදවල දී ඔබගේ නීතිඥවරයාගේ සහාය උපරිම වශයෙන් පැය 12 ක කාලයක් සඳහා කල් දැමීමට තීරණය කළ හැකිය.

# භාෂණ පරිවර්තකයෙකුගේ සහාය ලබා ගන්න

ඔබ ප්‍රංශ භාෂාව කථා නොකරන්නේ නම් හෝ තේරුම් නොගන්නේ නම්, ඔබගේ නඩු විභාගයේ දී සහ ඔබගේ නීතිඥවරයා සමග සන්නිවේදනය කිරීමේ දී භාෂණ පරිවර්තකයෙකුගේ සහාය නොමිලේ ලබා ගැනීමේ අයිතියක් ඔබට ඇත.

# අත්අඩංගුව අවසන් කිරීම සඳහා අදහස් දක්වන්න

මෙම මහේස්ත්‍රාත්වරයා අත්අඩංගුව දීර්ඝ කිරීමට තීරණය කළ විට එම පියවර අවසන් කිරීමට උත්සාහ කිරීම උදෙසා ඔබට රජයේ නීතීඥවරයාට හෝ විමර්ශන විනිසුරුවරයාට කරුණු දැක්විය හැකිය.

# ඔබගේ නඩුවට අදාල ඇතැම් කාරණාවලට යොමු වන්න

ඔබගේ හෝ ඔබගේ නීතිඥයාගේ ඉල්ලීම පරිදි සහ අත්අඩංගුව දීර්ඝ කිරීමට පෙර අවස්ථාවේ දී උපදෙස් ලබා ගැනීමට ඔබට මේ දේවල් ඉල්ලා සිටිය හැකිය:

- ඔබ අත්අඩංගුවට ගැනීම පිළිබඳ දැන්වීම;

– ඔබ පරීක්ෂා කළ වෛද්‍යවරයා විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතික(ය);

– ඔබගේ නඩු විභාගයේ සටහන්.

## රජයේ නීතිඥවරයාට අදහස් දක්වන්න

අත්අඩංගු කාලය අවසන් වී වසරකට පසු, ලැබුණු බවට රිසිට් පතක් සහිත ලියාපදිංචි ලිපියක් මගින් හෝ ලිපිකරුගේ කාර්යාලයට ප්‍රකාශයක් නිකුත් කිරීමෙන්, නිරීක්ෂණ ලබා ගැනීම සඳහා නඩු ගොනුව බැලීම පිණිස රජයේ නීතිඥවරයාගෙන් විමසීමක් කළ හැකිය.